දුරකතන අංක/தொலைபேசி இல./Telephone Nos.

අමාත්‍යතුමා
அமைச்சர்
Minister
2784832
2784807
2785617

ලේකම්
செயலாளர்
Secretary
2784812

කාර්යාලය
அலுவலகம்
Office
2785141-50
Fax: 2784846

ඊමේල් – மெயில் / E-mail : isurupaya@moe.gov.lk

අධ්‍යාපන අමාත්‍යාංශය

கல்விஅமைச்சு

Ministry of Education

'ඉසුරුපාය', ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ
බත්තරමුල්ල

'இசுருபாயா' ஸ்ரீ ஜயவர்தனபுரகோட்டை
பத்தரமுல்ல
"Isurupaya", SriJayawardhanapuraKotte
Battaramulla.

මගේ අංකය
எமது இல.
My No.
ED/9/15/2/3/3/7

ඔබේ අංකය
உமது இல.
Your No.

දිනය
திகதி
Date
2016.10. 05

ලේකම්,
ශ්‍රී ලංකා පාසල් චෙස් සංගමය,

**<u>ශ්‍රී ලංකා පාසල් චෙස් කණ්ඩායම් චෙස් උළෙල හා ශූරතාවලිය - 2016</u>**

උක්ත කරුණ සම්බන්ධයෙන් ඔබගේ 2016.09.05 දිනැති ලිපිය හා බැඳේ.

ඔබ සංගමය මඟින් සංවිධානය කරනු ලබන ඉහත තරගාවලියේ පළමු අදියර 2016.10.21 සිට 23දක්වා සහ 2016.11.04 සිට 06 දක්වා දිස්ත්‍රික් මට්ටමින්ද, දෙවන අදියර 2016.11.25 සිට 27 දක්වා සහ 2016.12.02 සිට 04 දක්වා පළාත් මට්ටමින්ද, තෙවන අදියර 2016.12.18 සිට 21 දක්වා හෝ 2016.12.21 සිට 24 දක්වා අන්තර් අධ්‍යාපන පළාත් මට්ටමින්ද පැවැත්වීමට අධ්‍යාපන අමාත්‍යාංශයේ අනුමැතිය මෙයින් ලබා දෙමි.

පහත සඳහන් කොන්දේසි යටතේ වගකීම ශ්‍රී ලංකා පාසල් චෙස් සංගමයේ සභාපති හා ලේකම් විසින් දැරිය යුතු බවද තවදුරටත් දන්වා සිටිමි.

**<u>කොන්දේසි</u>**

- **වයස අවු 13 න් පහළ වයස් කාණ්ඩය සඳහා තරගාවලියක් ලෙස පැවැත්වීමට අවසර නොදෙන අතර එය ළමුන්ගේ පරිසාධන මට්ටම ගණනය කර ඒ අනුව ක්‍රීඩා සැණකෙළි හෝ ක්‍රියාකාරකම් ලෙස පැවැත්වීමට කටයුතු කළ යුතු ය.**
- සහභාගී කරවන සියලුම ළමුන්ට ආරක්ෂාව සැලසෙන පරිදි සියලු කටයුතු සංවිධානය කළ යුතු ය.
- පාසල් සිසුන්ගේ විනය සුරැකීමේ වගකීම ශ්‍රී ලංකා පාසල් චෙස් සංගමයේ සභාපති හා ලේකම් විසින් දැරිය යුතු ය.
- සහභාගී වන සෑම ශිෂ්‍ය ශිෂ්‍යාවකගේම දෙමව්පියන්ගෙන් තරගාවලියට දරුවා සහභාගී කරවීමට කැමැත්ත ප්‍රකාශ කළ ලිපියක් අදාළ විදුහල්පතිවරයා විසින් සහතික කර ලබා ගත යුතු ය.
- තරගාවලියේ සහතික පත්‍ර මුද්‍රණයේ දී ශ්‍රී ලංකා පාසල් චෙස් තරගාවලියක් ලෙස සඳහන් කළ යුතු ය. ("සමස්ත ලංකා" යන්න භාවිතා නොකළ යුතු ය.)
- චෙස් ක්‍රීඩාවට අදාළ නීති රීති උල්ලංඝනය නොවන පරිදි තරගාවලිය පැවැත්විය යුතු ය.
- තරගය අවසන් වී සතියක් ඇතුළත ජයග්‍රහණ කණ්ඩායම් වල ක්‍රීඩකයින්ගේ නම්, ලබාදුන් සහතික අංක සමග ලේඛනයක් සහ ඒ පිළිබඳ සවිස්තර වාර්තාවක් මෙම අමාත්‍යාංශය වෙත ලබා දීමට කටයුතු කළ යුතු ය.
- මෙම තරගාවලිය පැවැත්වෙන අධ්‍යාපන කලාපයේ කලාප හා පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂකවරු වෙත අධ්‍යාපන අමාත්‍යාංශය අනුමත ලිපියේ අංකය හා දිනය සමඟ තරගාවලිය පිළිබඳ දැනුවත් කළ යුතු ය.

වී.උපාලි අමරතුංග
අධ්‍යාපන අධ්‍යක්ෂ(වැ.බ.)
(සෞඛ්‍ය, ශාරීරික අධ්‍යාපන හා ක්‍රීඩා)
අධ්‍යාපන ලේකම් වෙනුවට